# උතුරු පළාත් දෙමළ මාධ්‍ය පාසැල් වලට විද්‍යා හා ඉංග්‍රීසි විෂයයන් සඳහා පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තිය - 1(අ) ශ්‍රේණියේ තනතුරට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වූ විවෘත තරඟ විභාගය - 2018

උතුරු පළාතේ දෙමළ මාධ්‍ය පාසල් වල පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තිය - 1 (අ) ශ්‍රේණියේ තනතුරට **ඇමුණුම - 01 හි** සඳහන් ආකාරයේ පුරප්පාඩුවලට උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම් පූර්ණය කර ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. **ඇමුණුම - 02 හි** දක්වා ඇති ආකාරයේ විෂයයන්ට අදාළ සුදුසුකම් පූර්ණය කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම්පත් යොමු කිරීමට සුදුසුකම් ලබති. **ඇමුණුම – 01 හි** දක්වා ඇති පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් **2018 නොවැම්බර් මස** පැවැත්වීමට නියමිත බව දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **09.11.2018** වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසීන් :-

2.1 **අංක** 1885 / 38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිර්දේශ කරන ලද කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817 / 30** හා **2013.07.03** දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නිවේදනය කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වූ ආයතන ක්‍රියා පරිපාටින් සංග්‍රහය යනාදීන්ටත් අනාගතයේ දී මෙම සංග්‍රහයන් හි ඇති කරන යම්කිසි සංශෝධනයන්ට යටත්ව තෝරාගත් අපේක්ෂකයන් අදාළ තනතුරේ 3 වන පන්තිය - 1 (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 තරඟ විභාගය හා ව්‍යවහාර පරීක්ෂණය යනාදිය මඟින් පත්වීම් සඳහා සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර තුනක් (03) පරිවාස කාලයට යටත් කර පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි.

2.3 මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයකි. එබැවින් මෙම පත්වීම ලබන අපේක්ෂකයින් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසියට යටත්විය යුතුයි.

2.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අපේක්ෂකයෙක්, එම සේවා ස්ථානයේම අවම වශයෙන් **අවුරුදු 08 ක් අඛණ්ඩ සේවාවක් ඉටු කළ යුතුයි** යන කොන්දේසිය අත්‍යාවශ්‍ය කොන්දේසියකි.

2.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 හා මේ හා සම්බන්ධයෙන් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට එකඟව පත්වීමේ දින සිට වසර පහක් (05) ක් අවසන් වීමට ප්‍රථම නියමිත කරන ලද දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

2.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත් කිරීමට අපේක්ෂා කරන සංඛ්‍යාව **ඇමුණුම – 01** හි දක්වා ඇති පරිදි වේ. කෙසේ වුවද දන්වන ලද පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලය ද පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාව :-

මෙම තනතුරට අලුතින් බඳවා ගන්නා ලද ගුරුවරයෙක් පත්වීම බලපැවැත්වෙන දින සිට අංක **03 / 2016** දරණ **2016.02.25** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි, වැටුප් සංකේත අංක **GE 1 - 2016 රුපියල් 27,740 – 6 x 300 – 7 x 380 – 2 x 445 – 33,090** වන වැටුප් ක්‍රමයේ, **උප ඇමුණුම I** හි සඳහන් පරිදි 14 වන වැටුප් පියවර වන රුපියල් **32,200/-** හි පිහිටුවනු ලැබේ. කෙසේ වෙතත් ඔවුන්ට අදාළ වැටුප **උප ඇමුණුම II** හි සඳහන් පරිදි **රුපියල් 25, 536/-** ක් ප්‍රදානය කරන අතර ගැළපුම් දීමනාව වන රුපියල් **3, 112/-** ක් ද ගෙවනු ලැබේ. මීට අමතරව රජය විසින් රජයේ නිලධාරීන්ට කලින් කලට ගෙවනු ලබන දීමනා ද ලබා ගැනීමට හිමිකම් ඇත.

## 04. සාමාන්‍ය සුදුසුකම්:-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාත ස්ථිර පදිංචිය කරගත් අය විය යුතුයි. මෙම අයදුම් අවසන් දිනට ප්‍රථම වසර හයක් (06) අවම වශයෙන් වසර තුනක්වත් (03) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි.

**නැතිනම්**

දෙමාපියන් උතුරු පළාත උපන් ස්ථානය කොටගත් අය විය යුතු අතර අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩව පදිංචිවී සිටි පදිංචිකරුවන් විය යුතුයි. **(සම්මුඛ පරීක්ෂණයේ දී ග්‍රාම සේවක නිලධාරියා විසින් ලබා දෙන ලද ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන ලද "ඡන්ද හිමි නාම ලේඛණයේ ලියාපදිංචි කර ඇති චන්ද හිමියන්ගේ විස්තර සඳහන් කිරීමට යොදා ගන්නා ආකෘතිය" ඉදිරිපත් කළ යුතුයි)**

04.3 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය මනා ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් යුත් පුද්ගලයන් ද විය යුතුයි.

04.4 අයදුම්පත භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට ප්‍රථම සියළුම සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04.5 අයදුම්පත භාරගන්නා අවසාන දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **21 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි** විය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් :-

05.1 අංක **1885 / 38** දරණ **2014.10.23** දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාර **09.11.2018 වැනි** දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් ගුරු පත්වීමට අදාළව නිර්දේශිත විශේෂ විෂය ක්ෂේත්‍රයට අදාළ විශ්වවිද්‍යා ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හෝ විශ්වවිද්‍යා ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද උපාධි ප්‍රදාන ආයතනක් විසින් ප්‍රදානය කරන ලද විශ්ව විද්‍යා උපාධි සුදුසුකම් සහිත සහතික (**ඇමුණුම - 02 හි සඳහන් පරිදි**) හිමිව තිබිය යුතුයි. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අතරතුර යොමු කරන අයදුම්පත් හා ඉල්ලා ඇති අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිදු පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**නැතිනම්**

05.2 අ.පො.ස (සා/පෙ) විභාගයෙන් භාෂාව හා සාහිත්‍ය, ගණිතය යන විෂයයන් හි සමත් වී තිබිය යුතු යි.

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ලිඛිත පරීක්ෂණ හා ව්‍යවහාර පරීක්ෂණය යනාදිය මගින් කුසලතාව පදනම කරගෙන බඳවා ගන්නා අවස්ථාවේදී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථා සංග්‍රහය, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන් එකගව බඳවා ගැනීම් කටයුතු කරනු ලැබේ. මෙම දැන්වීම මඟින් ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව හඳුනාගතහොත් මෙම තනතුර සඳහා ඇති හිමිකම අහෝසි කරනු ලැබේ. එමෙන්ම මෙම තරඟ විභාගය සඳහා වූ අයදුම්පත් කැඳවා ලැබුණු අයදුම්පත් අතරින් සුදුසුකම් සහිත අයදුම්පත් අදාල විෂයයන් සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවක් දක්නට ලැබුණහොත් මෙම අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාග නොපවත්වා සම්මුඛ පරීක්ෂණයක් හා ව්‍යවහාර පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

06.2 ඉහත සඳහන් අයදුම්කරුවන්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන් ව්‍යවහාර පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර ලකුණු ලබා දෙන ආකාරය නිවේදනයේ 12.2 හි දක්වා ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරපත් කිරීමට අපොහොසත් වන සහතික කෙරෙහි පසුව සැළකිල්ලට ගනු නොලැබේ.

06.3 පුරප්පාඩුවලින් 03% ක් විශේෂිත අවශ්‍යතාවයන් ඇති අයට (ආබාධිත) වෙන් කරනු ලැබේ. අපේක්ෂකයෙක් පත්වීම් සඳහා තෝරා ගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂිත අවශ්‍යතා තත්වය (Disability) බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සහතික කළ යුතුයි. කෙසේ වෙතත් විශේෂ අවශ්‍යතාවයක් ඇති අපේක්ෂකයෙක් ලිඛිත හා ව්‍යවහාර පරීක්ෂණයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා පදනම මත පත්වීම් සඳහා සුදුසුකම් ලබා ගනියි.

## 07. විභාග ගාස්තු :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රුපියල් **500.00** ක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ට අයත් **3401** යන තැන්පතු ගිණුමට බැර කළ කුවිතාන්සියක් ලබා අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු නැවත ගෙවනු නොලැබෙන අතර මෙම ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට අනුමැතිය දෙනු නොලැබේ.

## 08. අයදුම් කරන ක්‍රමය :-

08.1 මෙම දැන්වීම් අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (සෙ.මී21 x සෙ.මී 29) කඩදාසියේ 1 සිට 10 දක්වා ඡේද පළමු පිටුවේ ද 11 සිට 14 දක්වා ඡේද දෙවන පිටුවේ ද අනෙක් කොටස් ඊළඟ කොටසේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **09.11.2018** වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක :393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"විද්‍යා හා ඉංග්‍රීසි විෂයන් සඳහා පවතින පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ– 1(අ) ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය – 2018"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

08.3 අයදුම්කරුවන් තම සුදුසුකම්වලට අදාළව **සුදුසු විෂයයන්ට** (නිවේදනයේ **ඇමුණුම – 02** හි සඳහන් කර ඇති විෂයන්ට) පමණක් අයදුම් කිරීමේ දී එම **විෂය / විෂයයන් සඳහන් කර එක් අයදුම්පතක්** පමණක් යොමු කළ යුතුයි. අයදුම්කරු විසින් අයදුම් කළ විෂයයන්ට අදාළව පත්වීම් ප්‍රදානය කෙරේ. මෙම **උපාධි ගුරුසේවයේ තරඟ විභාගය සඳහා අයදුම් කරන විෂය / විෂයයන්** පසුව කිසිදු හේතුවක් නිසා හෝ වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙන්නේ නැත. අයදුම්කරු තම සුදුසුකම් අනුව උපරිම වශයෙන් විෂයයන් **තුනකට (03)** පමණක් ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව සඳහන් කළ හැකිය. නමුත් පත්වීමට අදාළ විෂය පුරප්පාඩු සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ.

08.4 අයදුම්පත්‍රයේ **ඡායා පිටපත** ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත යනාදී භාරගනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු **අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට** පිළිගැනීමක් සේ සැළකිය නොයුතුයි.

08.5 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසකම් පූර්ණය කරනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සඳහා කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ

08.6 අයදුම්පත් ඉදිරිපත් කරන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ හා සම්බන්ධ පුවත්පත් නිවේදනයක් ද නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයෙකුට දැන්වීම නිකුත් කර විභාග දිනයට අඩුම වශයෙන් දින තුනකට (03) පෙර හෝ විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම්, ප්‍රවේශ පත්‍ර නොලැබීම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක :393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි.
(දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංකය - 021 221 9940)

**සටහන්** :-

ප්‍රවේශපත්‍රය සම්බන්ධ ඉල්ලීම් ලිපිය, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

## 09. විභාග අපේක්ෂකගේ අනන්‍යතාවය :-

අපේක්ෂකයන් තමා පෙනී සිටින එක් එක් විෂයයන් සම්බන්ධයෙන් අධීක්ෂක සෑහීමකට පත්වන ආකාරයකට ඔබගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් යම්කිසි ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම්පත්
(ii) වලංගු විදේශ බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයෙකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත විසින් අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන දඬුවමකට යටත් විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයෙන් නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුයි. මෙම විභාග රෙගුලාසීන් ප්‍රකාර යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ අපේක්ෂකයාට සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදා යනාදියේ අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් 395,520.00 ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව සිටින ආගමික නායකයන් යන අයගෙන් කෙනෙකු ස්ථිර කළ යුතු.

## 12. විභාග සැලැස්ම :-

මෙම විභාග ලිඛිත හා ව්‍යවහාර පරීක්ෂණ වශයෙන් කොටස් දෙකකින් යුත් පරීක්ණයකි ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්ණවලින් යුත් විභාගයක් වන අතර දෙමළ මාධ්‍ය පාසල්වල පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ තරග විභාගයක් වන බැවින් අයදුම්කරුවන් මෙම විභාගයට දෙමළ මාධ්‍යයෙන් පමණක් පෙනී සිටිය හැකිය.

### 12.1 ලිඛිත විභාගය

මෙම ලිඛිත විභාගයට පෙනී සිට සමත් නොවූ කිසිම විභාග අපේක්ෂකයෙකුට නැවති නිවැරදි කිරීමේ අයදුම්වලට විධිවිධාන යොදා නැත.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | වේලාව | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | විභාග අපේක්ෂකයෙකුට ගුරු සේවය සඳහා පිළිඹුවන දක්ෂතාවයන් තර්කානුකූල දැනුම සම්බන්ධ ඇගයීමක් කිරීමේ අරමුණින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලබයි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්න 50 කින් යුත් ප්‍රශ්න පත්‍රයකි. සියළුම ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනුම | ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනීම හෝ දේශිය වශයෙන් සිදු වී ඇති හා සිදුවිය හැකි අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයිය හැකි පරිදි මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 | 100 |

**සටහන** :-

මෙම විභාගය එක් තරග විභාගයකි සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහාම වෙන් කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් ලකුණු හතලිහ බැගින් (40%) අපේක්ෂකයන් ලබා ගත යුතුයි. එසේ වුවද සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් ලබා ගන්නා ලද සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැළකිල්ලට ගනු ලැබේ.

### 12.2 ව්‍යවහාර පරීක්ෂණය

ලිඛිත විභාගයෙන් සමත් වූ අපේක්ෂකයන්ට ව්‍යවහාර පරීක්ෂණය වශයෙන් අයදුම්කරුවන් විසින් හඳුනාගත් තේමාව යටතේ ඉදිරිපත් කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් ආකාරයට ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

| ව්‍යවහාර පරීක්ෂණයට ලකුණු ප්‍රදානය කරන ලක්ෂණය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අරමුණු හා ප්‍රවේශය **(Objective and the Approach)** | 05 | 02 |
| 02. පෞරුෂත්වය හා හඬ පාලනය **(Personality and Voice Control)** | 05 | 02 |
| 03. සන්නිවේදනයේ පැහැදිලි භාවය **(Clarity in the Communication)** | 05 | 02 |
| 04. කාල කළමනාකරණය **(Time Management)** | 05 | 02 |
| 05. ඉදිරිපත් කිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතය **(Usage of Techniques of Presentation)** | 05 | 02 |
| **සම්පූර්ණ** | **25** | **10** |

**සටහන:**

තරග විභාගයෙන් සමත්වන විභාග අපේක්ෂකයන්ගෙන්, අංක 1885/38 හා 2014.10.23 වන දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිර්දේශ කරන ලද ව්‍යවහාර පරීක්ෂණය සඳහා විභාග අපේක්ෂකයන් කැඳවනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල :-

අපේක්ෂකයන් සඳහා විභාග ප්‍රතිඵල, අදාළ ගුරු තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ හා ව්‍යවහාර පරීක්ෂණ පවත්වා පත්වීම් බලධාරියා විසින් පත්වීම් සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලියෙන් පසු උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර් ජාලය මගින් නිකුත් කරනු ලැබේ. එමෙන් ම විභාගයට පෙනී සිටිය සියළුම විභාග අපේක්ෂකයන්ට තැපැල් මගින් ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

## 14. විභාග මධ්‍යස්ථාන :-

විභාගය පැවැත්වීමට අපේක්ෂිත නගර හා එම නගරවල අංක පහත සඳහන් වේ,

| *නගරය* | *නගර අංක* |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලයිතීව් | 05 |

එක් විභාග නගරයක් සඳහා ලැබෙන අයදුම්පත්වල සංඛ්‍යාව අඩුවන අවස්ථාවකදී මෙම විභාග මධ්‍යස්ථානයට ආසන්නව පිහිටි විභාග නගරයක විභාගය පැවැත්වීමට කටයුතු යෙදීමට ඉඩ ඇත.

15. මෙම විභාගය පැවැත්වීම් හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා සතුව ඇති අතර දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

16. මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

**අ. සිවපාලසුන්දරන්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
08.10.2018

## කලාප අධ්‍යාපන මට්ටමේ විෂයයන් අනුව පවතින පුරප්පාඩු

( "--" යන සලකුණ පුරප්පාඩු නැති බව පෙන්නුම් කරයි)

| | | විෂයයන් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අංක | කලාපය | රසායනික විද්‍යාව | භෞතික විද්‍යාව | විද්‍යාව | ගණිතය | තොරතුරු තාක්ෂණය | ඉංග්‍රීසි | සම්පූර්ණ |
| 01. | යාපනය | - | - | - | - | 12 | 4 | **16** |
| 02. | වලිකාමම් | - | - | 6 | 10 | 8 | 8 | **32** |
| 03. | වඩමරාච්චිය | - | - | - | - | 15 | 4 | **19** |
| 04. | තෙන්මරාච්චිය | - | - | 5 | 10 | 9 | 5 | **29** |
| 05. | දූපත් | 2 | 1 | 14 | 22 | - | 3 | **42** |
| 06. | කිලිනොච්චිය | 2 | 1 | 34 | 36 | - | 5 | **78** |
| 07. | මුලයිතිව් | 2 | 1 | 16 | 17 | 3 | 2 | **41** |
| 08. | තුණුක්කායි | 2 | 2 | 7 | 18 | - | 4 | **33** |
| 09. | වවුනියාව උතුර | 1 | 1 | 20 | 16 | - | - | **38** |
| 10. | වවුනියාව දකුණ | 1 | 1 | 8 | 16 | 6 | - | **32** |
| 11. | මන්නාරම | 1 | 1 | 22 | 33 | 4 | 5 | **66** |
| 12. | මඩු | 1 | 1 | 5 | 6 | - | 1 | **14** |
| | **සම්පූර්ණ** | **12** | **9** | **137** | **184** | **57** | **41** | **440** |

## පාඨමාලා හා අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්

| විෂය අංකය | පාඨමාලාව | අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| I | බෞද්ධ විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක **බෞද්ධ විද්‍යා විෂය** ප්‍රධාන විෂයයන්ගෙන් එකක්/ විශේෂ විෂයක් කොටගත් විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |
| II | රසායන විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක් **රසායන විද්‍යා විෂය** ප්‍රධාන විෂයයන්ගෙන් එකක් කොටගත් / විශේෂ විෂයක් කොටගත් විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |
| III | විද්‍යාව | පිළිගත් විශ්වවිද්‍යාලයක **ජීව විද්‍යා** / **රසායන විද්‍යාව** / **භෞතික විද්‍යා** පාඨම ප්‍රධාන විෂයයන්ගෙන් එකක් කරගත් විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි.<br>**නැතිනම්**<br>පිළිගත් විශ්වවිද්‍යාලයක **ජීව විද්‍යා** / **ජීව විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ (කෘෂි අධ්‍යයන / ආහාර හා පෝෂණය වැනි)** පාඨම ප්‍රධාන විෂය කොටගත් විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |
| IV | ගණිතය | පිළිගත් විශ්වවිද්‍යාලයක **ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය** යන විෂයන් දෙකම ප්‍රධාන විෂය කොටගත් විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |
| V | තොරතුරු තාක්ෂණය | පිළිගත් විශ්වවිද්‍යාලයක ලබාගත් තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව යන විෂයන්ගෙන් එකක් ප්‍රධාන විෂය කරගත් විද්‍යාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |
| VI | ඉංග්‍රීසි | පිළිගත් විශ්වවිද්‍යාලයක **ඉංග්‍රීසි පාඨම** ප්‍රධාන විෂයන්ගෙන් එකක් කරගත් / විශේෂ විෂයක් කොටගත් කලාවේදී උපාධිධාරියෙකු විය යුතුයි. |